**කොටපොළ ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොටපොළ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කොටපොළ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබූ රු.1,495,325 ක ස්ථාවර තැම්පත් ගිණුම් තුනකට අදාල පොලිය සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ස්ථාවර තැන්පත් 03ක් වෙනුවෙන් ලැබිය යුතු පොලිය හා ස්ථාවර තැන්පත් 03ක ශේෂය පිළිවෙළින් රු.789,624 කින් හා රු.1,653,626 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | මාතර හා කොටපොල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලට අදාලව අදායම ලෙස උපලේඛන මඟින් තහවුරු කර තිබූ ලැබිය යුතු රු.12,091,250 ක මුද්දර ගාස්තු හා සමාලෝචිත වර්ෂයේ අවසන් මාස 03 ට අදාළව ලැබිය යුතු රු.994,091 ක උසාවි දඩ ගාස්තු, ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර එවා තිබූ මුද්දර ගාස්තු රු.262,000 ක මුදල ගිණුම්ගත කර ඇති බව හා නිර්දේශ කර නොතිබූ රු.991,091ක උසාවි දඩ ආදායම ගිණුම්ගත කර නොමැති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ඉකුත් වර්ෂවලට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු අදායම රු.12,514,500 ක් වූ නමුත් එය රු.4,874,000 ක් ලෙස ගැලපීම් කිරීම නිසා මුද්දර ගාස්තු ආදායම රු.7,640,500 ක් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි. | ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරීමේදි එය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කර අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ඉන්වෙන්ට්‍රි හා පාරිභෝජන ස්වරූපයේ රු.118,749 ක් වටිනා අයිතම 68 ක් ලී බඩු හා උපකරණ යටතේ හා රු104,165 ක් වටිනා අයිතම 39 ක් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ද ගිණුම්ගත කර තිබුණු අතර සභා පරිශ්‍රය තුළ ස්ථාපිත කර තිබූ රු.519,740 ක් වටිනා CCTV කැමරා පද්ධතිය ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.51,472,021 ක් වූ ගිණුම් විෂයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 1,356,373 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.5,833,966 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,014,000 | 2,653,246 | 2,616,855 | 1,082,036 | 2,113,000 | 1,742,876 | 1,893,544 | 1,045,645 |
| (ii) | කුලී | 13,617,000 | 8,685,888 | 8,962,047 | 990,729 | 6,610,000 | 4,613,649 | 4,888,161 | 1,266,888 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,112,000 | 1,484,769 | 1,484,769 | - | 2,837,000 | 298,247 | 298,247 | - |
| (iv) | වෙනත් ආදායම් | 16,200,000 | 13,627,853 | 14,112,794 | 1,906,882 | 13,947,000 | 4,122,398 | 4,087,785 | 2,391,823 |
| | එකතුව | 33,943,000 | 26,451,756 | 27,176,465 | 3,979,647 | 25,507,000 | 10,777,170 | 11,167,737 | 4,704,356 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂය ආරම්භයේ හිඟ වරිපනම් ශේෂය රු.60,285 ක් වූ අතර ඒකක 850 කට අදාළව බිල් කිරීම් රු.617,431 ක් සමඟ රු.677,716 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ දී මුළු අයවීම් රු.569,636ක් වීම නිසා වර්ෂය අවසානයට | හිඟ ශේෂය අය කර ගැනීමට අදාළ කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වරිපනම් ඒකක 7 කට අදාළව රු.108,080 ක හිඟ ශේෂයක් පැවතුණි.ඉන් රු.140,414ක් වූ ශේෂ වර්ෂ 02 ත් 05 ත් අතර කාලයක සිට අයවිය යුතුව පැවතුණි. | | |
| (ආ) | කොටපොළ උතුර සහ කොටපොළ දකුණ දියුණු කළ ප්‍රදේශ ලෙස හඳුනාගෙන තිබූ නමුත් වරිපනම් දේපල තක්සේරුව ලබා ගෙන වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 පෙබරවාරි 22 දින ගැසට් පත්‍රයේ පළ කර, දේපළ වාර්තා සකස් කර තක්සේරු සිදු කිරීමට අදාළ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | වර්ෂය ආරම්භයට හිඟ අක්කර බදු ශේෂය රු.70,358 ක් වූ අතර බිල් කිරීම් රු.40,956 ක් සමඟ රු.111,314 ක් අය විය යුතුව තිබුණි. වර්ෂය තුළ දී මුළු අයවීම රු.47,440 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.63,874 ක හිඟ ශේෂයක් තිබුණි. | තව දුරටත් හිඟ අක්කර බදු අය කර ගැනීම සඳහා ඉඩම් පවතින ස්ථාන වෙත ගොස් අය කර ගැනීමට කටයුතු කරන බවත්, එසේ නොහැකි ශේෂ කපා හැරීම සඳහා කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ඈ) | වර්ෂය ආරම්භයට හිඟ ව්‍යාපාර බදු ශේෂය රු.495,870 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය තුළ බිල් කිරීම් රු.1,972,860 ක් සමඟ රු.2,468,730ක් අය විය යුතුව තිබුණි. වර්ෂය තුළ දී මුළු අයවීම රු.1,977,780 ක් වීම නිසා අවසානයට රු.490,950 ක හිඟ ශේෂයක් පැවතුණි. වර්ෂය අවසානයට ඉකුත් වර්ෂවලට අදාළව රු.304,070 ක් තවදුරටත් අය විය යුතුව තිබූ අතර එය මුළු හිඟයෙන් සියයට 62 ක් විය. | සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති හිඟයෙන් 2024 අප්‍රේල් 30 දින වනවිට රු.74,200 ක් අය කර ගෙන ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ඉ) | සභාව සතු මාළු ලැලි 03 කට අදාළව වර්ෂ 02 ත් 05ත් අතර කාලයක සිට අය විය යුතු රු.723,919 ක කුලී ආදායමක් සමාලෝචිත වර්ෂය තුළ දී ද අය කර ගෙන නොතිබුණි. | අදාළ හිඟය අය කර ගැනීම සඳහා අධිකරණයේ නඩු පවරා එම නඩු විභාග වෙමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ඊ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට උසාවි දඩ ලෙස රු.329,753 ක් අය විය යුතුව තිබුණි. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට අයවිය යුතුව තිබූ 2023 සැප්තැම්බර් මාසයට අදාළ උසාවි දඩ මුදල් 2024 ජනවාරි 04 දින ලැබී ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 උප වගන්තිය ප්‍රකාර නාගරික නොවන බල ප්‍රදේශය තුළ ගොඩනැඟිලි සැලසුම් අනුමත කිරීම, ඉඩම් අනුබෙදුම් කිරීම සම්බන්ධ කටයුතු, හා ශ්‍රවණාගාරය කුලියට දීම හා පැවිනා බුරුස්ගල ආදායම් අයකිරීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කර පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කිරීමෙන් පසු එහි අඩුපාඩු පවතින බව දන්වා තිබූ බැවින් අතුරු ව්‍යවස්ථා සකස් කිරීමේ කටයුතු අතරමග නතර වී ඇති බවත්. විමර්ශන නිළධාරීගේ සහය ලබා ගෙන ඉදිරියේදී එම කාර්යයන් අවසන් කිරීමට කටයුතු කරන බව. | අතුරු ව්‍යවස්ථා කඩිනමින් සකස් කළ යුතුය. |
| (ආ) සභා බලප්‍රදේශය තුළ දෛනිකව එක්රැස් කරන කසළ ටොන් 06 පමණ කසළ වලින් නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීම සඳහා ස්ථිර හා විධිමත් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් සමාලෝචිත වර්ෂය තුළදී ද ක්‍රියාත්මක කර නොතිබුණු අතර නොදිරන කසළ අනින්කන්ද ප්‍රදේශයේ පිහිටි සභාව සතු ඉඩමක වල දැමීම සිදුකර තිබුණි. | ගැනුම්කරුවන්ගේ අවශ්‍යතාව පරිදි පොලිතින් පිරිසිදු කර ලබාදීමට පහසුකම් නොපවතින බැවින් ඒවා එක් රැස් කර තබා ගන්නා බවත්, අනෙකුත් නොදිරන කසළ වල දැමීම සිදු කරනු ලබන බව හා ඉල්ලුම් කර ඇති ඉන්සියුලේටර් යන්ත්‍රය ලැබුණු පසු නොදිරන කසළ නිසි පරිදි දහනය කර පරිසරයට හිතකර අයුරින් විනාශ කිරීමට කටයුතු කරන බව . | විධිමත් කසළ කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතුය. |

**3.2 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 අප්‍රේල් 10 දින රු.900,900 ක් වැය කර මිලදී ගෙන තිබූ ෆීනික්ස් නෙළුම් වර්ගයේ ප්ලාස්ටික් පුටු 1300 න් ඌනතාවයක් පැවති පුටු 170 සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර වගකිවයුත්තන් හඳුනාගෙන අදාළ වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුටු අස්ථානගතවීම සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි මේ වන විටත් සොයා ගැනීමට නොහැකි වීම නිසා පුටු තොගයේ ඌණතාවය අඩු කර ගැනීමට නොහැකි වී ඇති බවත්, සිදු වූ පාඩුව අය කර ගැනීම සඳහා මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව විමර්ශන නිළධාරිගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර ඒ අනුව කටයුතු කරමින් පවතින බවත්, ඉදිරියේදී මෙවැනි තත්වයන් ඇති නොවීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2009 වර්ෂයේදී රු.මිලියන 7.2 ක් වැයකර එක්තරා පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබූ JCB යන්ත්‍රය දෝෂ සහිත බව දක්වමින් 2012 වර්ෂයේ බස්නාහිර පළාත්බද මහාධිකරණයේ (වාණිජ) නඩුවක් පවරා ඒ වෙනුවෙන් සභා අරමුදලින් නීතිඥ උපදේශන ගාස්තු වශයෙන් රු.765,250 ක් වැයකර තිබූ අතර සභාව නඩුවෙන් පරාජය වීම හේතුවෙන් 2022 වර්ෂයේදී නීති උපදේශන ආයතනය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනා පෙත්සමක් ගොනු කරන ලෙස දැනුම් දී තිබුණද ඒ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් නොවූ අතර ඊට අදාළ විමර්ෂන කටයුතු ද මේ දක්වා සිදුකර නොතිබුණි. | ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනා පෙත්සම් ගොනු කරන ලෙස දැනුම් දී තිබුණ ද සභාව විසින් ඒ සඳහා නීති උපදේශන ගාස්තු නොගෙවන ලද බවත්, 2024 අප්‍රේල් 27 දින වන තෙක් මෙම රථය සම්බන්ධයෙන් සොයා බැලීමට පත් කළ කමිටු සාමාජිකයින් කිසිවකු පරීක්ෂණය සඳහා පැමිණ නොමැති බව. | යෝජිත ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සභා බලප්‍රදේශයේ පිහිටි හෝටල් හා ආපන ශාලා 05 කින් 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළව සියයට 1 ක ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණු අතර 2019 ගිණුම් වර්ෂයට අදාළව එක්තරා ආයතනයකින් රු.1,018,580 ක් අයවිය යුතු වුවත් රු.707,996 ක් පමණක් අයකිරීම නිසා විගණිත දිනය වූ 2024 පෙබරවාරි 12 දින වන විටත් රු.310,584 අයවිය යුතුව තිබුණි. | සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල් 05ක් ඇති බවත්, ඉන් 03ක් ගාස්තු ගෙවා බලපත්‍ර ලබා ගෙන ඇති බවත්, එක් ආයතනයකට නඩු පැවරීමක් කළ ද ඒ අතරතුර බදුකරු මිය ගිය බැවින් නව බදුකරු වෙත ගාස්තු ගෙවා බලපත්‍රය ලබා ගන්නා ලෙස දැනුවත් කර ඇති බවත්, අනෙක් ආයතනය පැවති ආර්ථික අර්බුධය හමුවේ එය වැසී යාමේ තර්ජනයට මුහුණ දී තිබූ බැවින් ගාස්තු කොටස් වශයෙන් ගෙවීමට අවස්ථාව ලබා දී ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සංවර්ධන බලපත්‍රයක් ලබා ගැනීමෙන් තොරව සභා බලප්‍රදේශයේ නාගරික සීමාවට අයත් දෙනියාය පල්ලේගම ප්‍රධාන මාර්ගයේ මධ්‍යයේ සිට අඩි 50 ක ගොඩනැගිලි සීමාවන් නොතබා වර්ග මීටර් 52.14 ක තනි මහල් ගොඩනැගිල්ලක් ඉදි කර තිබුණි. | KPS/BA/UDA/2022/02 අංක දරණ ගොඩනැගිලි අයදුම්පත්‍රයට අදාළ කැබලි සැලැස්මේ පර්චස් 06 ට වඩා අඩු බැවින් නාගරික සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කමිටුව විසින් අනුමැතිය ලබා දිය නොහැකි බවට ලිපි යොමුකර ඇති බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | අංක 310/2 පල්ලේගම පාර, දෙනියාය යන ස්ථානයේ දෙමහල් වාණිජ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ලබා දී තිබූ සංවර්ධන බලපත්‍රයට පරික්ෂාවේදී Roof Top කොටසද ඇතුළත්ව මහල් | ගොඩනැගිලි සැලැස්මේ පළමු මහල සඳහා ROOF TOP කොටස ඇතුළත් කර ඉදිරිපත් කර ඇති බවත්, සැලැස්මට පරිබාහිරව ඉදිකිරිම් කර ඇති බැවින් | අනවසර ඉදිකිරීම් විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට |

| | | |
|---|---|---|
| 03 කින් යුතු ගොඩනැගිල්ලක්, දෙනියාය පල්ලේගම ප්‍රධාන මාර්ගයේ මධ්‍යයේ සිට අඩි 32 ක සීමාවේ ඉදිකරමින් තිබුණු අතර අනුමත ගොඩනැගිලි සැලැස්මට අනුව බිම් මහලේ ප්‍රමාණය වර්ග මීටර් 94.39 ක් වූ නමුත් ඉදිකර තිබූ ගොඩනැගිල්ලේ බිම් මහලේ ප්‍රමාණය වර්ග මීටර් 116.6 ක් විය. | සංශෝධිත සැලැස්මක් ඉදිරිපත් කරන ලෙස දැනුවත් කර ඇති බවත්, දෙනියාය පල්ලේගම මාර්ග මධ්‍යයේ සිට අඩි 35 ක දුරින් ඉදිකිරීම නිර්දේශ කරන බවට ප්‍රාදේශිය ඉංජිනේරු, මාකඳුර කාර්යාලය මගින් දැනුම් දී ඇති බව. | කටයුතු කළ යුතුය. |

**3.5 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෘත්තීය සමිති සම්මේලන සඳහා සහභාගි වන නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් සැලසීම වෙනුවෙන් පෞද්ගලික පාර්ශවයන් වෙත ගෙවීම් කිරීමට නෛතික ප්‍රතිපාදනයක් සලසා නොතිබියදී 2023 ජූලි 29 දින මඩකලපුව සර්වෝදය මධ්‍යස්ථානයේ දී පැවති පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සංගමයේ 2023 වර්ෂයේ වාර්ෂික සම්මේලනයට සහභාගී වීම සඳහා ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් 07 දෙනෙකුට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් රු.88,900 ක් පෞද්ගලික පාර්ශවයන් වෙත සභා අරමුදලින් ගෙවා තිබුණි. | ආණ්ඩුකාරවරගේ අංක G/SP/4/3/8/06 හා 2023 සැප්තැම්බර් 06 දිනැති ලිපිය මඟින් ලබා දී තිබූ අනුමැතියට යටත්ව සම්මේලනය සඳහා කැඳවීම් ලිපිය, දුම්රිය මිල ගණන් කැඳවූ ලිපිය හා අදාළ නිළධාරීන් ඊට සහභාගී වූ බවට තහවුරු කරන ලිපිය ආදී සියළු ලේඛන පරීක්ෂා කර ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 2 වන වගන්තිය අනුව ගෙවීම සිදු කර ඇති බව. | ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ රු.1,446,020 ක් වැයකර කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්ත 02 කට අදාළව මාර්ග අදර ඉදි කිරීමේ දී නියමිත උසට මාර්ග අදර ඉදි කර නොතිබීම නිසා කොන්ක්‍රීට් ඝන මීටරයකට රු.19,532.25 බැගින් ඝන මීටර් 1.86 ක් වෙනුවෙන් රු.36,330 ක් ද, මාර්ග අදර සකස් කිරීමේදී නියමිත උසට හැඩයම් භාවිතා කර නොතිබීම නිසා හැඩයම් වර්ගමීටර් 25.05 ක් සඳහා රු.23,232 ක මුදලක් ද වශයෙන් එකතුව රු.59,562 ක මුදලක් වැඩිපුර බිල්පත්වල ඇතුළත් කර තිබුණි. | අදාළ කර්මාන්ත 02 න් ඉහලගම එච්.ජී.මාර්ගය සංවර්ධනය කිරීමට අදාළව වැඩිපුර බිල්පතට ඇතුළත් කර තිබූ රු.32,652 ක මුදල මේ වන විටත් අයකර ගැනීමට කටයුතු කර ඇති බව. | ඉටු කළ වැඩ කොටස් සඳහා ගෙවීම් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ රු.919,717 ක් වැයකර වැඩ අවසන් කර තිබූ දන්දෙනියගහේන මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමේ දී අංක 01 වැඩ විෂය යටතේ කොන්ක්‍රීට් ඇතිරීමට පෙර මාර්ග තලය මීටර් 0.10 ක් පස් කපා පහත් කිරීම වෙනුවෙන් පස් ඝනමීටර් 21.75 ක් කැපීම සඳහා රු.1,848.65 බැගින් රු.40,208 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා | විගණන නිරීක්ෂණය සඳහා පිළිතුරු සැපයීම සඳහා කාලය ප්‍රමාණවත් නොවන බැවින් පිළිතුරු සැපයීම සඳහා අමතර සති 02 ක කාලයක් ඉල්ලා ඇති බව. | ඉටු කළ වැඩ කොටස් සඳහා ගෙවීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබූ නමුත් 2024 පෙබරවාරි 12 දින සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මාර්ගය කොන්ක්‍රීට් කිරීමට පෙර මාර්ග තලය පස් කපා ඉවත් කිරීමක් සිදු කර නොතිබුණි | | |
| (ඇ) | රු.312,499 ක නිමි වැඩ අවසන් කර තිබූ හැන්ෆර්ඩ් වත්තේ පොදු වැසිකිළි පහසුකම් සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ වැඩ විෂයයන් 02 ක ලීටර් 500 ප්‍රමාණයේ Arpico Plastishell Hybrid Double Layer වර්ගයේ ප්ලාස්ටික් ජල ටැංකියක් සවිකිරීම හා Otto/Rosell හෝ ඊට සමාන වර්ගයේ වැසිකිළි පෝච්චි 02 ක් සවිකිරීම යන වැඩ කොටස් ඊට අදාළ වැඩ විස්තරයට අනුකූලව ඉටු කර නොතිබියදී කොන්ත්‍රාත්කරුට රු.29,470 ක මුදලක් ගෙවා තිබුණි. තවද උක්ත කර්මාන්තයේ වැඩ විෂයයන් 05 කට අදාළව මිනුම් පත්‍රයේ සඳහන් වැඩ ප්‍රමාණයන් ඉටු කර නොතිබිය දී රු.13,474 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි | විගණන නිරීක්ෂණය සඳහා පිළිතුරු සැපයීම සඳහා කාලය ප්‍රමාණවත් නොවන බැවින් පිළිතුරු සැපයීම සඳහා අමතර සති 02ක කාලයක් ඉල්ලා ඇති බව. | ඉටු කළ වැඩ කොටස් සඳහා ගෙවීම් කළ යුතුය. |
| (ඇ) | මෙදේරිපිටිය පැරණි පාලම වෙනුවට නව පාලමක් ඉදිකිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබූ කොන්ත්‍රාත්තුවට අදාළව තාවකාලික පාලමක් ඉදිකිරීම අදාළ කොන්ත්‍රාත්කරුගේ කාර්යභාරයක් වන නමුත්, කොටපොල ප්‍රාදේශීය සභාව විසින් අදාළ තාවකාලික පාලම ඉදිකිරීමේදී දොඹකර ගාස්තු හා සිමෙන්ති සැපයීම සඳහා රු.420,604 ක මුදලක් සභා අරමුදලින් වැය කර තිබුණි. | විගණන නිරීක්ෂණය සඳහා පිළිතුරු සැපයීම සඳහා කාලය ප්‍රමාණවත් නොවන බැවින් පිළිතුරු සැපයීම සඳහා අමතර සති 02ක කාලයක් ඉල්ලා ඇති බව. | ගිවිසුම්ගත කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ගෙවීම් කළ යුතුය. |